සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

23 S I

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 13 - 2020

විභාග අංකය .............................

## දේශපාලන විද්‍යාව I

කාලය පැය දෙකයි

- **මෙම ප්‍රශ්න පත්‍රය A - B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර, A කොටස බහුවරණ ප්‍රශ්න 30කින් හා B කොටස කෙටි ප්‍රශ්න 20 කින් යුක්ත වේ.**
- **සියළුම ප්‍රශ්න වලට පිළිතුරු ප්‍රශ්න පත්‍රයේම සැපයිය යුතුයි.**
- **එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.**

### A කොටස

- **අංක 1 සිට 10 දක්වා ප්‍රශ්න අතරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.**

01. දේශපාලන විද්‍යාව හැදෑරීම තුලින්,
    1. දේශපාලනය සම්බන්ධ පැතිකඩ අධ්‍යනය කරයි.
    2. පවතින න්‍යාය හා සංකල්ප විචාරය කරයි.
    3. අධ්‍යාත්මික ජීවිතය කළමනාකරණය කරයි.
    4. අලුත් න්‍යාය හා සංකල්ප ගොඩනගයි.
    5. දේශපාලන ක්‍රම හා ප්‍රතිපත්ති විචාරයට ලක්කරයි. (.....)

02. දේශපාලන චර්යාවාදී ප්‍රවේශය,
    1. ආනුභවික හා වාස්තවික දත්ත හා සාක්ෂි මත පදනම්ව ඇත.
    2. වටිනාකම් විනිශ්චයන්ගෙන් සමන්විතය.
    3. ආත්මීය නිගමන, විශ්වාස යනාදියෙන් නිදහස්ය.
    4. නව ශිල්පීය ක්‍රම භාවිත කරයි.
    5. නිරවද්‍යතාව සහතික කරගත් කරුණු පමණක් පර්යේෂණ සඳහා භාවිතා කරයි. (.....)

03. රාජ්‍ය හා ආණ්ඩුව,
    1. ඕනෑම සමාජයක මූලික සහ කේන්ද්‍රීය දේශපාලන ආයතනය වේ.
    2. පූර්ව ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමවල පටන්ම ආයතන දෙකක් ලෙස ක්‍රියාත්මක විය.
    3. සමාජයේ ඇති අනෙක් බොහෝ ආයතන ප්‍රභවය ලබන්නේ මේ තුලිනි.
    4. රාජ්‍ය සතු බලය ආණ්ඩුව ප්‍රායෝගිකව ක්‍රියාවට නංවයි.
    5. ග්‍රීක යුගයේ පටන් මේ දක්වාම දේශපාලනයේ ප්‍රධාන තේමාව විය. (.....)

04. දේශපාලන පක්ෂ,
    1. ආණ්ඩු බලය ලබාගැනීම සඳහා පමණක් ක්‍රියාත්මක වේ.
    2. විසිරී ඇති මහජන මතය ඒකරාශී කරයි.
    3. දේශපාලන ප්‍රභූ ස්ථර නිර්මාණය කරයි.
    4. ආණ්ඩුවේ කටයුතු සංවිධානය කරයි.
    5. ඡන්ද දායක අභිලාශ දේශපාලන ක්‍රියාවලිය තුලට ගෙන යයි. (.....)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

05. නූතන ජාතික රාජ්‍ය,
1. නිශ්චිත දේශ සීමා සහිතය.
2. ''එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයකි'' යන සංකල්පය මත පදනම්ව ඇත.
3. වර්තමානයේ 'බහුත්වවාදය' යන සංකල්පය පිලිගනී.
4. ප්‍රථමයෙන් වර්ධනය වූයේ 17 වැනි සියවසේ යුරෝපයේය.
5. වර්තමානයේ දී රාජ්‍ය හා ජාතිය ගොඩනැගීමේ ක්‍රියාවලියේදී මහත් අර්බුදවලට මුහුණ පා ඇත. (.....)

06 නව ලිබරල්වාදී රාජ්‍ය තුළ,
1. ජාතික රාජ්‍යයේ දේශසීමාව ඉක්මවා වෙළඳපොල ආර්ථික ක්‍රමය ශීඝ්‍ර ව්‍යාප්තියකට ලක් විය.
2. වෙළඳපොල හැසිරවීම සඳහා කිසිදු ප්‍රයත්නයක් දැරීමට රාජ්‍යයට අවකාශයක් නොමැත.
3. සුභසාධනවාදී රාජ්‍ය සංකල්පය ක්‍රියාත්මක විය.
4. වෙළඳපොල ආර්ථිකයට අනුරූපික ලෙස ජගත්කරණය වූ සංස්කෘතියක් ද වර්ධනය විය.
5. ගෝලීයකරණය යන සංකල්පය බිහි විය. (.....)

07. සන්ධීය ආණ්ඩුක්‍රම පිහිටුවා ගැනීමට මුල්වන හේතු වන්නේ,
1. බාහිර තර්ජනයක පැවැත්ම.
2. අන්තර්ජාතික සම්බන්ධතා මනාව කළමනාකරණය කිරීම.
3. භූමියේ විශාලත්වය හා විවිධත්වය.
4. ආර්ථික සංවර්ධනය.
5. දැඩි ජනවාර්ගික බෙදීම්වලින් තොර වීම. (.....)

08. අර්ධ සන්ධීය ආණ්ඩු ක්‍රමය,
1. ඒකීය හා සන්ධීය ආණ්ඩුක්‍රම දෙකට අතරමැද ආණ්ඩුක්‍රමයකි.
2. ද්විත්ව ආණ්ඩු ආයතන පවතී.
3. ඉන්දියාව තුල ක්‍රියාත්මකය.
4. මධ්‍යම ආණ්ඩුවට විශාල බලතල ප්‍රමාණයක් අත්පත් කරදෙයි.
5. කැමති අවස්ථාවක වෙන්ව යාමේ අයිතිය සහිත ප්‍රාන්ත ආණ්ඩු පැවතීම. (.....)

09. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය,
1. ව්‍යවස්ථාදායකය හා විධායකය අතර පැහැදිලි බෙදීමක් දැකිය නොහැකිය.
2. නිරන්තරයෙන් බ්‍රිතාන්‍ය ආර්ශයට ගනී.
3. සාමූහික වගකීමේ සංකල්පය මත පදනම් වේ.
4. රාජ්‍ය නායකයා සෘජු ලෙසින් තෝරාපත්කර ගනී.
5. මෙහි විධායකය විශ්වාසභංග යෝජනාවක් මගින් ඉවත් කල හැක. (.....)

10. ලිබරල්වාදී මතවාදය,
1. සර්ව බලධාරී රාජාණ්ඩු ක්‍රමයට එරෙහිව නිර්මාණය විය.
2. සීමා, බාධා, මැදිහත්වීම්, වලින් තොරව ලබන නිදහස අගය කරයි.
3. ආණ්ඩුවේ වගකීම වන්නේ පොදු දේපළ ක්‍රමය සහතික කිරීම බව පවසයි.
4. අවධි තුනක් ඔස්සේ විකාශනය විය.
5. නිදහස් වෙළඳපොල හා නිදහස් ආර්ථිකය සමඟ බැදී ඇත. (.....)

- අංක 11 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා අදාල නිවැරදි පිළිතුරු කාණ්ඩය තෝරන්න.

11. සමාජ ප්‍රජාතන්ත්‍රවාදයට අනුව ධනවාදය සමාජවාදී මූලධර්ම අනුව ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රතිපත්තිමය පියවර වන්නේ,
A – ආර්ථික ක්ෂේත්‍රයට රාජ්‍ය මැදිහත් නොවීම.
B – මිශ්‍ර ආර්ථිකය.
C – සමාජ සුභසාධනය.
D – ආදායම් හා ධනය සමාජයේ යළි බෙදාහැරීම.
E – සාමූහික කේවල් කිරීම.

1. ABCD  2. BCDE  3. ABDE  4 ACDE  5. ABCE (.....)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

12. ලිබරල් නිරාගමිකවාදයේ මූලධර්ම වන්නේ,
A – රාජ්‍යය සහ පල්ලිය ආයතනික වශයෙන් වෙන් කිරීම.
B – රාජ්‍ය, ආගම සමඟ අනන්‍ය නොවීම.
C – රාජ්‍ය කිසිම ආගමකට පක්ෂපාතී නොවීම.
D – ආගමික නිදහස පුරවැසි අයිතිවාසිකමක් වීම.
E – ආගමට පැවතිය හැක්කේ රාජ්‍යයේ අවසරය මත පමණි.

1. ABCD 2. BCDE 3. ABDE 4 ACDE 5. ABCE (.....)

13. නිශේධනීය ගැටුම් වන්නේ,
A – පළමුවන හා දෙවන ලෝක යුද්ධය.
B – ත්‍රස්තවාදී හා ත්‍රස්ත විරෝධී යුද්ධ.
C – එකිනෙකට පසමිතුරු සමාජ පන්ති අතර ඉතිහාසය පුරාම ඇති වූ ගැටුම්.
D – ජනවාර්ගික ගැටුම්.
E – අන්තර් රාජ්‍ය යුද්ධය.

1. ABCD 2. BCDE 3. ABDE 4 ACDE 5. ABCE (.....)

14. ප්‍රජාතන්ත්‍රවාදය සඳහා අවශ්‍ය පූර්ව කොන්දේසි වන්නේ,
A – ව්‍යවස්ථානුකූලවාදය.
B – පොදු දේපළ ක්‍රමය.
C – දේශපාලන හා ආර්ථික තරඟය.
D – සංවරණ හා තුලන ජාල.
E – මැතිවරණ හා වෙළඳපොල සම්බන්ධ නිදහස් වරණය.

1. ABCD 2. BCDE 3. ABDE 4 ACDE 5. ABCE (.....)

15. ඇමරිකානු ආණ්ඩුක්‍රමය,
A – 'මහජන පරමාධිපත්‍ය' යන සිද්ධාන්තය මත පදනම් වේ.
B – ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කරයි.
C – සංවරන තුලන සිද්ධාන්තය අනුගමනය කරයි.
D – සිරිත් විරිත්, සම්ප්‍රධායන් හා භාවිත ආශ්‍රය කරගනී.
E – දෘඪ භාවයෙන් යුක්ත නොවේ.

1. ABCD 2. BCDE 3. ABDE 4 ACDE 5. ABCE (.....)

16. ඉන්දියානු ආණ්ඩුක්‍රමය,
A – ලෝකයේ දීර්ඝතම ව්‍යවස්ථාවට හිමිකම් කියයි.
B – ප්‍රාන්ත රාජ්‍ය 29කින් හා සාංගමික ප්‍රදේශ 7කින් යුක්ත වේ.
C – ශක්තිමත් මධ්‍යම ආණ්ඩුවකින් යුක්ත වේ.
D – අසමමිතික බල බෙදීමක් පවතී.
E – අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යටතේ ක්‍රියාත්මක වේ.

1. ABCD 2. BCDE 3. ABDE 4 ACDE 5. ABCE (.....)

17. ප්‍රතිපත්ති ක්‍රියාදාමයේ අවධි වන්නේ,
A – න්‍යාය පත්‍රය සකස් කිරීම.
B – ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම.
C – ප්‍රතිපත්ති ඇගයීම.
D – ප්‍රතිපත්ති උපදේශනය.
E – ප්‍රතිපත්ති ඇවර කිරීම.

1. ABCD 2. BCDE 3. ABDE 4 ACDE 5. ABCE (.....)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

18. 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණයේ ප්‍රතිඵල වන්නේ,
A – ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම පදනම් කරගත් පාලන ක්‍රමයක් නිර්මාණය වීම.
B – පාලන බලය විමධ්‍යගත වීම.
C – ආයාත නිර්යාත ආර්ථික ක්‍රමයක් සඳහා පදනම වැටීම.
D – නිදහස්, ස්වාධීන සිවිල් සේවාවක් වර්ධනය වීමේ ආරම්භක පදනම වැටීම.
E – මිනිසුන් සමූහ සජීවි කරණය වීමේ ක්‍රියාදාමයට පදනම වැටීම.

1. ABCD 2. BCDE 3. ABDE 4 ACDE 5. ABCE (.....)

19. ඩොනමෝර් ප්‍රතිසංස්කරණය යටතේ,
A – සමාජ සුභසාධනය වේගවත් කරන ලදි.
B – වාර්ගික නියෝජනය අහෝසි කරන ලදි.
C – වයස අවු.18ට වැඩි සියලු දෙනාට ඡන්ද බලය හිමිවිය.
D – වගකීමේ ආණ්ඩුක්‍රමයක් ලබාදෙන ලදි.
E – නැගී එමින් පැවති සමාජවාදී ව්‍යාපාරය අඩපණ කරන ලදි.

1. ABCD 2. BCDE 3. ABDE 4 ACDE 5. ABCE (.....)

20. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ බලයට පැවති සීමාවන් සම්බන්ධ **නිවැරදි** ප්‍රකාශය වන්නේ,
A – ලංකාව සම්බන්ධයෙන් නීති පැනවීමට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට බලය හිමිවීම.
B – ඩොනමෝර් ව්‍යවස්ථාව සංශෝදනය කිරීමේ බලය රාජ්‍ය මන්ත්‍රන සභාවට පැවතීම.
C – විදේශ කටයුතු සම්බන්ධයෙන් නීති පැනවීමට රාජ්‍ය මන්ත්‍රණ සභාවට නොහැකිවීම.
D – රාජ්‍ය මන්ත්‍රණ සභාව විසුරුවා හැරීමට ආණ්ඩුකරුට හැකිවීම.
E – රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සෑම තීරණයක්ම ආණ්ඩුකරුට දැන්විය යුතු වීම.

1. ABCD 2. BCDE 3. ABDE 4 ACDE 5. ABCE (.....)

- **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවලට වඩාත් නිවැරදි හෝ ගැලපෙන පිළිතුර තෝරන්න.**

21. සොල්බරි ආණ්ඩුක්‍රමය යටතේ,
1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම්‍ය හා ලිඛිත විය.
2. අධිකරණ සේවයේ ස්වාධීනත්වය සඳහා ආයතන දෙකක් නිර්මාණය කරන ලදි.
3. පාර්ලිමේනතු පරමාධිපත්‍ය ක්‍රියාත්මක විය.
4. බ්‍රිතාන්‍යයේ දේශපාලන ක්‍රමයට සමාන දේශපාලන ක්‍රමයක් ඇතිකරන ලදි.
5. ඒකමාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් හඳුන්වා දෙන ලදි. (.....)

22. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ විධායකය,
1. අග්‍රාණ්ඩුකාරවරයා රාජ්‍ය නායකයා විය.
2. සත්‍ය විධායක බලය හිමිවූයේ අග්‍රාණ්ඩුකාරවරයාටයි.
3. රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය සඳහා ආයතන දෙකක් නිර්මාණය කරන ලදි.
4. සත්‍ය විධායකයේ නිලකාලය වසර 06ක් විය.
5. අග්‍රාණ්ඩුකරු මෙරට ජනතාව විසින් පත්කරන ලදි. (.....)

23. 1972 ආණ්ඩු ක්‍රමය,
1. විධායක ජනාධිපතිධූරය සහිත ආණ්ඩුක්‍රමයක් ප්‍රදානය කරන ලදි.
2. ස්වාධීන රාජ්‍ය සේවයක් ඇති කරන ලදි.
3. සෙනෙට් සභාව එලෙසම පවත්වාගෙන ගියේය.
4. ශ්‍රේෂ්ඨාධිකරණයට ව්‍යවස්ථා විවරණ බලය හිමිකර දෙන ලදි.
5. ලංකාව ජනරජයක් බවට පත්කරන ලදි. (.....)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

24. 1972 ආණ්ඩුක්‍රමය යටතේ ව්‍යවස්ථාදායකය,
1. නිලකාලය වසර 5කි.
2. මෙරට දේශපාලන ක්‍රමය තුල උත්තරීතර ආයතනය විය.
3. මණ්ඩල දෙකකින් සමන්විතය.
4. පාර්ලිමේන්තු පරමාධිපත්‍ය හිමි නොවීය.
5. පාර්ලිමේනතුව යන නමින් හදුන්වන ලදි. (.....)

25. මෙරට යටත්විජිත පරිවර්තනය තුළ,
1. අනිවාර්‍ය රාජකාරී ක්‍රමය ක්‍රියාත්මක විය.
2. යැපුම් ආර්ථිකය එලෙසම පවත්වාගෙන යන ලදි.
3. වක්‍ර බදු වෙනුවට ඍජු බදු ක්‍රමයක් හදුන්වාදෙන ලදි.
4. ව්‍යවස්ථාදායක හා විධායක සභා ඇති විය.
5. රාජ්‍ය වෙළඳ ඒකාධිකාරය එලෙසම පවත්වාගෙන ගියේය. (.....)

- **අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට අදාලව වගන්ති දෙක බැගින් දී ඇත. එම වගන්ති සඳහා වඩාත් ගැලපෙන්නේ පහත දක්වා ඇති හැඳින්වීම් වලින් කවරක් ද යන්න තෝරා 1, 2, 3, 4, 5, ලෙස ඒවා නම් කරන්න.**

| අංකය | ප්‍රකාශ I | ප්‍රකාශ II |
|---|---|---|
| 1 | සත්‍යය | සත්‍යය |
| 2 | සත්‍යය | අසත්‍යය |
| 3 | අසත්‍යය | සත්‍යය |
| 4 | අසත්‍යය | අසත්‍යය |
| 5 | සත්‍යය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | ප්‍රකාශය I | ප්‍රකාශය II |
|---|---|---|
| 26 | 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණය යටතේ ද්විත්ව පාලනය අහෝසි කරන ලදි. | මේ ආණ්ඩුක්‍රමය යටතේ මුළු ලංකාවම එක් පොදු නීති ක්‍රමයක් යටතට ගෙන එන ලදි. (.....) |
| 27 | 1910 කෲව් මැකලම් ප්‍රතිසංස්කරණයෙන් ලංකාව ඡන්ද බලය හදුන්වාදෙන ලදි. | ඒ ලංකාවේ මුළු ජනගහනයෙන් 4% ක් වැනි ප්‍රමාණයකටයි. (.....) |
| 28 | ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ආණ්ඩු ක්‍රමය තුල වැදගත් පුද්ගලයා වූයේ ආණ්ඩුකාරවයායි. | මෙම ආණ්ඩුක්‍රමයේ දී දේශීය නියෝජිතයන්ට පාලනයේ දී වැඩි බලතල ප්‍රමාණයක් හිමිවිය. (.....) |
| 29 | සොල්බරි ව්‍යවස්ථාදායකය ප්‍රධාන ආයතන තුනකින් සමන්විත විය. | නියෝජිතයන් ව්‍යවස්ථාදායකයට තෝරා පත් කර ගැනීම සඳහා භාවිතා කරනු ලැබුයේ සමානුපාතික නියෝජන ක්‍රමයයි. (.....) |
| 30 | 1972 ආණ්ඩු ක්‍රමය යටතේ මූලික මිනිස් අයිතිවාසිකම් පිළිගත් අතර අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීමේ බලය අධිකරණයට ලබාදෙන ලදි. | මෙම ආණ්ඩුක්‍රමය යටතේ 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය' නමින් වෙනම අධිකරණයක් ස්ථාපිත කරන ලදි. (.....) |



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

## B කොටස

31. ''දේශපාලනය යන්න පුරවැසි සමාජ භාවිතයකි'' මේ සඳහා ඉදිරිපත් කළ හැකි කරුණු දෙකක් ලියන්න.

1. ..................................................

2. ..................................................

32. පාර්ලිමේන්තු ආයතනයක පැවැත්ම සඳහා ගැඩගැසුනු භාවිත ගණනාවක් පවතී. ඒවැනි භාවිත දෙකක් ලියන්න.

1. ..................................................

2. ..................................................

33. දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයට අදාලව පහත සඳහන් තේමා හඳුනාගෙන නම් කරන්න.

1. සමාජයේ දේශපාලනයට බලපෑම් කරන, දේශපාලන ක්‍රියාකාරීත්වයට හා ගමනට මඟ පෙන්වන, සමාජයේ විශාල ජනකොටසක් ආකර්ශනය කරගැනීමට, සමත්වන දේශපාලන මතිමතාන්තර හා විශ්වාස ආදියෙන් සමන්විත නිශ්චිත අදහස් සමුච්චයකි.

..................................................

2. සමාජයේ සිදුවන සංසිද්ධි එසේ සිදුවන්නේ මන්දැයි පැහැදිලි කිරීමට හා විග්‍රහකිරීමට භාවිතා කරන විධික්‍රමික මෙවලමකි.

..................................................

34. පහත වගන්ති වලින් ප්‍රකාශ වන දේශපාලන ආයතන නම් කරන්න.

1. මැතිවරණ හෝ වෙනත් මාධ්‍යයක් හෝ මගින් ආණ්ඩු බලය ලබාගැනීම අරමුණු කරගෙන ගොඩනගා ඇති සංවිධානයකි.

..................................................

2. රාජ්‍යයෙන් පරිබාහිරව හා ස්වාධිනව පුරවැසියන් තම පොදු අරමුණු වෙනුවෙන් එකට සංවිධාන වී සහ සාමූහිකව ක්‍රියාත්මක සමාජ අවකාශයයි.

..................................................

35. පහත සඳහන් ප්‍රකාශවලින් කියවෙන රාජ්‍ය මාදිලි මොනවාදැයි නම් කරන්න.

1. රාජ්‍ය සමාජ සංවිධානයක් නොව සමාජයට ඉහළින් පවතින්නක් වේ - ..................................................

2. කම්කරු පන්ති ආඥා දායකත්වය යටතේ, ආර්ථික සම්පත් හා නිශ්පාදන ක්‍රියාවලියේ පෞද්ගලික අයිතිය අහෝසි කොට සමාජිය පෙදු අධිකාරය ස්ථාපිත කරයි - ..................................................

36. ස්වාධිපත්‍ය බලය පිළිබඳ සංකල්පය වර්ථමානය වන විට බරපතල අභියෝගයකට ලක් වී තිබේ. ඊට ප්‍රධාන සාධක දෙකක් හේතු වී ඇත. එම සාධක දෙක නම්කරන්න.

1. ..................................................

2. ..................................................

37. සමාජ සම්මුතිවාදය න්‍යායක් ලෙස ඉදිරිපත් කරන ලද චින්තකයින් දෙදෙනෙක් නම් කරන්න.

1. ..................................................

2. ..................................................



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

38. විධායක බලය සංවිධානය වීම අනුව පවත්නා ආණ්ඩුක්‍රම ආකෘති දෙකක් නම් කරන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

39. සමූහාණ්ඩුවාදයේ පොදු හරාත්මක මූලධර්ම කිහිපයක්ම තිබේ. ඉන් දෙකක් නම් කරන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

40. ගැටුම් පිළිබඳ දේශපාලනමය වර්ගීකරණය තුන් ආකාර වේ. ඉන් අකාර දෙකක් ලියන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

41. ස්විස්ටර්ලන්ත ආණ්ඩුව තල තුනකින් සමන්විත වේ. ඉන් දෙකක් දක්වන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

42. සීමිත ආණ්ඩු පිළිබඳ සංකල්පය වර්ධනය වීමේදී පසුකාලයේ දී එයට අංග කිහිපයක් එකතු විය. ඉන් දෙකක් දක්වන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

43. විජිතකාරක රාජ්‍ය යටත් විජිතවල විජිත රාජ්‍යයක් ගොඩනගාගන්නේ හා යම්යම් සමාජ, ආර්ථික, දේශපාලන හා පරිපාලන ප්‍රතිසංස්කරණ හඳුන්වාදුන්නේ හේතු කිහිපයක් නිසාය. ඉන් දෙකක් දක්වන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

44. කෝල්බෲක් ප්‍රතිසංස්කරණය අනුව 1833 දී නිර්මාණය කල ව්‍යවස්ථාදායක සභාව සමන්විත වූයේ දෙවර්ගයකට අයත් සාමාජික සංඛ්‍යාවකිනි. එම දෙවර්ගය හා සාමාජිකයන් සංඛ්‍යාව වෙන් වෙන්ම දක්වන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

45. ඩොනමෝර් ප්‍රතිසංස්කරණය මෙරට හඳුන්වාදීම කෙරෙහි බලපෑ හේතු සාධක දෙකක් ලියන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

46. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ මෙරට ද්විත්ව විධායකයක් නිර්මාණය විය. එම ද්විත්ව විධායකයේ පාර්ශව දෙක හඳුන්වන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

47. 1948 ආණ්ඩු ක්‍රමය යටතේ නිර්මාණය කරන ලද සෙනෙට් සභාව පිහිටුවීමේ අරමුණු 02ක් ලියන්න.

1. ..........................................................................................................................................................

2. ..........................................................................................................................................................

48. සොල්බරි ආණ්ඩුක්‍රමට එරෙහිව පවතින විවේචන 02ක් ලියන්න.

1. ..........................................................................................................................................................

2. ..........................................................................................................................................................

49. 1. ශ්‍රී ලංකාවේ මූලික මිනිස් අයිතිවාසිකම් හඳුන්වාදීමට පියවර ගනු ලැබූ මුල්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කුමක්ද?

..........................................................................................................................................................

2. රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ මූලධර්මය ප්‍රථම වතාවට ලංකාවට හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කුමක්ද?

..........................................................................................................................................................

50. මෙරටට වාර්ගික නියෝජන හඳුන්වාදුන් හා වාර්ගික නියෝජනය අහෝසි කළ ආණ්ඩුක්‍රම මොනවාදැයි පිළිවෙලින් නම්කරන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

(31 - 50 ප්‍රශ්නවලට ලකුණු 2 බැගින්)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

**23 | S | II**

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**First Term Test - Grade 13 - 2020**

විභාග අංකය .............................  දේශපාලන විද්‍යාව II  කාලය පැය තුනයි

**සැලකිය යුතුයි :**

- **මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්ත වේ.**
- **පළමුවැනි කොටසින් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයක්ද,**
- **දෙවැනි කොටසින් යටත් පිරිසෙයින් ප්‍රශ්න දෙකක්ද,**
- **තුන්වැනි කොටසින් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයක්ද වන සේ තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**

## I කොටස

01. දේශපාලනය යනු කුමක්ද? විමසන්න. (ලකුණු 20)
02. රාජ්‍ය සහ එහි භූමිකාව සාකච්ඡා කරන්න. (ලකුණු 20)
03. ඒකීය හා සන්ධීය ආණ්ඩුක්‍රමය සසදන්න. (ලකුණු 20)

## II කොටස

04. යටත් විජිත පරිවර්තනය තුළ සිදු වූ දේශපාලන පරිවර්තන පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

05. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පමණක් විස්තර කරන්න.
    (i) සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම.
    (ii) සොල්බරි ආණ්ඩුක්‍රමය යටතේ සුළු ජාතීන්ගේ රැකවරණය සඳහා යොදා තිබූ විධිවිධාන.
    (iii) සොල්බරි ආණ්ඩුක්‍රමය යටතේ සෙනෙට් සභාව.
    (iv) අග්‍රාණ්ඩුකාරධූරය. (10x2=20)

06. සොල්බරි ආණ්ඩුක්‍රමය යටතේ සහ 1972 ආණ්ඩුක්‍රමය යටතේ ව්‍යවස්ථාදායකයේ බලතල සාකච්ඡා කරන්න. (ලකුණු 20)

07. 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ පහත මාතෘකාවලින් දෙකක් විමසන්න.
    (i) රාජ්‍ය සේවය (ii) නාමික විධායකය (iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය. (10x2=20)

## III කොටස

08. පහත මාතෘකා අතරින් ඕනෑම දෙකක් සාකච්ඡා කරන්න.
    (i) ගැටුම් ජීවන ක්‍රමය.
    (ii) ප්‍රතිපත්ති ක්‍රියාදාමය.
    (iii) ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රමයේ ප්‍රජාතාන්ත්‍රවාදී හා ප්‍රජාතාන්ත්‍රවාදී නොවන අංග.
    (iv) මිශ්‍ර ආණ්ඩුක්‍රමය. (10x2=20)

09. ඉන්දීය ආණ්ඩුක්‍රමයේ අර්ධ සංඝීය ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 20)

10. පහත මාතෘකා වලින් ඕනෑම දෙකක් විමසන්න.
    (i) නිරාගමික වාදය (ii) තුලනාත්මක ප්‍රවේශය
    (iii) ගෝලීයකරණය සහ රාජ්‍ය (iv) බලපෑම් කණ්ඩායම (10x2=20)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

## පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020 - දේශපාලන විද්‍යාව

## පිළිතුරු පත්‍රය - A කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | - 03 | | (11) | - 02 | | (21) | - 04 |
| (02) | - 02 | | (12) | - 01 | | (22) | - 01 |
| (03) | - 02 | | (13) | - 03 | | (23) | - 05 |
| (04) | - 01 | | (14) | - 04 | | (24) | - 02 |
| (05) | - 04 | | (15) | - 01 | | (25) | - 04 |
| (06) | - 03 | | (16) | - 01 | | (26) | - 01 |
| (07) | - 05 | | (17) | - 05 | | (27) | - 05 |
| (08) | - 05 | | (18) | - 04 | | (28) | - 02 |
| (09) | - 04 | | (19) | - 03 | | (29) | - 02 |
| (10) | - 03 | | (20) | - 04 | | (30) | - 03 |

## B කොටස

31. 1. පුරවැසියන් විසින් පාලකයන් පත්කිරීම. 2. දේශපාලන පක්ෂවල ක්‍රියාකාරී සමාජිකයින් වීම... ආදී
32. 1. ප්‍රජාතන්ත්‍රවාදය 2. මැතිවරණ ක්‍රියාවලිය 3. මහජන පරමාධිපත්‍ය පිළිගැනීම... ආදී
33. 1. දේශපාලන මතවාද 2. දේශපාලන න්‍යාය
34. 1. දේශපාලනය පක්ෂ 2. සිවිල් සමාජය
35. 1. ෆැසිස්ට්වාදී රාජ්‍ය 2. සමාජවාදී රාජ්‍ය මාදිලිය
36. 1. සංධීය වාදය 2. ගෝලීයකරණ ක්‍රියාවලිය
37. 1. තෝමස් හොබ්ස් 2. ජෝන් ලොක් 3. රූසෝ
38. 1. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය 2. ජනාධිපති ආණ්ඩුක්‍රමය
    3. මිශ්‍ර ආණ්ඩුක්‍රමය 4. ඒකතන්ත්‍ර ආණ්ඩුක්‍රමය
39. 1. රාජාණ්ඩුවාදයට විරුද්ධ වීම
    2. පරමාධිපත්‍ය බලයේ හිමිකරු පාලකයා නොව මහජනතාව වීම
    3. රාජ්‍ය නායකයා මහජන ඡන්දයෙන් පත් කරගත යුතු වීම
    4. පුරවැසියා දේශපාලන වශයෙන් සක්‍රීය, විපරම්කාරී වීම .... ආදී
40. 1. අන්තර් රාජ්‍ය ගැටුම 2. රාජ්‍ය අභ්‍යන්තර ගැටුම 3. රාජ්‍ය නිර්මාණ ගැටුම
41. 1. මධ්‍යම ආණ්ඩුව 2. කැන්ටන
    3. කොමියුන යනුවෙන් හඳුන්වන පළාත් පාලන ආයතන
42. 1. අභිනියෝජිත බලය 2. භාරකාරත්වය සහ කොන්දේසි සහගතබව. 3. සීමිත ධූරකාලය.
    4. නීතියේ ආධිපත්‍ය. 5. බලතල බෙදීම. 6. සංවරණ හා තුලන...... ආදී
43. 1. තම විජිතය පවත්වාගෙන යාමේ ආරක්ෂක හා පරිපාලන වියදම් අධික වීම හා සෘජුව විජිතය පාලනය කිරීම අපහසු වීම.
    2. තමන්ට අබිමුව ඇති නව සමාජයේ ඇති ජීවන රටා හා අභිලාශ විජිතකාරකයාගේ සංස්කෘතිය සමඟ නොපෑහීම නිසා ඒවා වෙනස් කරගැනීම
    3. තමන්ට යටත් වැසි සමාජ තම මවු රාජ්‍යයේ උපරිම යහපත සඳහා භාවිතයට ගැනීම.
44. 1. නිලලත් - 09 2. නිල නොලත් - 06
45. 1. දෙවන මැනිං ප්‍රතිසංස්කරණයේ දුර්වලතා 2. ආණ්ඩුකරුගේ ඉල්ලීම්
    3. ලංකා සමාජයේ විවිධ සංවිධානවල ඉල්ලීම් 4. බ්‍රිතාන්‍ය ආණ්ඩු වෙනස්වීම
    5. ඉන්දියානු ජාතික ව්‍යාපාරයේ බලපෑම
46. 1. ආණ්ඩුකාරවරයා සහ රාජ්‍ය නිලධාරීන් තිදෙනා
    2. ලාංකික අමාත්‍යවරුන්
47. 1. මහජන මන්ත්‍රී මණ්ඩලයේ හදිසි හා අපරක්ෂාකාරී ව්‍යවස්ථාදායක කාර්යයන් වළක්වාලීම
    2. සුළු ජන කොටස් වල ආශාවන් ආරක්ෂා කිරීම
    3. උගත් බුද්ධිමත් පුද්ගලයින්ගේ සේවය රටට ලබා දීම ....... ආදී
48. 1. මෙම ආණ්ඩුක්‍රමය යටතේ පාර්ලිමේන්තු ස්වාධිපත්‍ය නොයෙක් කරුණු වලින් සීමා වීම.
    2. මේ යටතේ මෙරටට ඩොමිනියන් නිදහස හම්වීම
    3. මෙරට අවසාන අභියාචනාධිකරණ බලය බ්‍රිතාන්‍ය ප්‍රිවිකවුන්සිලයට හිමි වීම.
    4. මෙරට රාජ්‍ය නායකයා රැජිණ වීම.
49. 1. 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව
    2. 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව
50. 1. 1833 කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
    2. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

NWP-EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

# II පත්‍රය

01. දේශපාලනය යන්නෙහි සරල අදහස කෙටියෙන් පැහැදිලි කර, එහි ගැඹුරු අර්ථය විස්තර විය යුතුවේ. එනම්,
**I** රාජ්‍ය, රාජ්‍ය පාලනය හා ආණ්ඩුකරණය පිළිබඳ ඇඟවෙන සංකල්පයක් බවට කරුණු ඉදිරිපත් කිරීම.
**II** දේශපාලනය රාජ්‍යයට පමණක් සීමා නොවී පුරවැසියන්ද සහභාගී වන සමාජ භාවිතාවක් බව විස්තර කිරීම.
ඊට අමතරව පහත අර්ථීකථනද ඉදිරිපත් වී ඇතිබව විස්තර කිරීම
- දේශපාලනය දේශපාලකයින්ගේ වෘත්තීයක් බව - බලය හා ආධිපත්‍ය අතර සම්බන්ධතාවයක් බව

02. රාජ්‍ය හැඳින්වීම.
රාජ්‍ය සතු සම්ප්‍රධායික තර්කයන් දැක්වීම.
- නීති සම්පාදනය - නීති ක්‍රියාත්මක කිරීම - යුක්තිය පිඹිඳලීම
ඉන් පසු සමකාලීන ලෝකයේ රාජ්‍යවල කාර්‍යභාරය කරුණු වශයෙන් විස්තර කිරීම.

03. ඒකීය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ හා සන්ධීය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ ඉදිරිපත් කොට සැසඳිය යුතුය.

### II. කොටස

04. මුලින්ම යටත් විජිත පාලනය පිළිබඳ කෙටි හැඳින්වීමක් කොට යටත් විජිත පාලන කාලය තුල ඔවුන් ඇතිකල ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය නිසා ඇතිවූ දේශපාලන ප්‍රතිඵල දැක්විය යුතුය. එහිදී එම ප්‍රතිඵල සඳහා බලපෑ යෝජනා ද ඊට පෙර ලංකාවේ පැවති තත්ත්වයද සඳහන් කල යුතුය.

05. I. ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් නිර්මාණය වීමේ මුල බීජය කෝල්බෲක් ප්‍රතිසංස්කරණයෙන් ලැබුන බවත් 1910 කෲව් මැකලම් ප්‍රතිසංස්කරණයෙන් සීමිත ඡන්ද බලය ලබාදුන් බවත් සඳහන් කරමින් ප්‍රවේශය ලබා ගතයුතුය. ඉන්පසු 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය යටතේ සර්ව ජන ඡන්දබලය ලබා දෙන බවත්, ඊට බලපෑ හේතු කාරකත්, සර්ව ජන ඡන්දබලය ලබාදීම නිසා මෙරට ඇති වූ ප්‍රතිඵලත් සඳහන් කල යුතුය.
II. සෝල්බරි ආණ්ඩුක්‍රමය පිළිබඳ කෙටි හැඳින්වීමක් කර සුළු ජාතීන්ගේ රැකවරණය සඳහා යොදා තිබූ විධිවිධාන දැක්විය යුතුය.
III. වෙස්ට්මිනිස්ටර් ආණ්ඩුක්‍රම ආකෘතිය අනුව මෙරට සොල්බරි ආණ්ඩුක්‍රමය නිර්මාණය කළ බවත් සඳහන් කල යුතු අතර සෙනෙට් සභාව ඇති කිරීම සඳහා බලපෑ හේතු, එහි බලතල හා කාර්යයන්ද දැක්විය යුතුය.
IV. සොල්බරි ආණ්ඩුක්‍රමය යටතේ අග්‍රාණ්ඩුකාරධූරය නාමික විධායකය බවත් සඳහන් කර පත්කරන ආකාරය ඉවත් කිරීම ආදී තොරතුරු අග්‍රාණ්ඩුකාරවරයාට හිමි වී තිබුන ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණ බලතල දැක්විය යුතු අතර ඒ අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයේ උපදෙස් අනුව බව දැක්විය යුතුය.

06. මේ යටතේ කරුණු දැක්වීමේදී සෝල්බරි ව්‍යවස්ථාදායකය හා 1972 ව්‍යවස්ථාදායකය පිළිබඳ මූලික තොරතුරු ඉදිරිපත් කොට ඒවායෙහි බලතල සඳහන් කොට 1972 ව්‍යවස්ථාදායකය බලවත් බව සනාථ කල යුතුය.

07. I. රාජ්‍ය සේවය හඳුන්වා, රාජ්‍ය සේවයේ වගකීම අමාත්‍ය මණ්ඩලය සතු කල බවද, රාජ්‍ය සේවයේ ඉහළම නිළධාරීන් අගමැතිවරයාගේ උපදෙස් මත ජනාධිපති විසින් පත් කරන බවද, ඔවුන් හැර අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ පත් කිරීම්, මාරු කිරීම්, සේවයෙන් පහ කිරීම් හා විනයානුකූලව ක්‍රියාමාර්ග ගැනීම් සඳහා රාජ්‍යසේවා උපදේශක මණ්ඩලය හා රාජ්‍යසේවා විනය මණ්ඩලය ස්ථාපිත කලද මෙම ආයතන දෙකෙහි උපදෙස් හා නිර්දේශ නොසලකා ක්‍රියාකිරීමට ඇමති මණ්ඩලයට හැකි වූ බැවින් මෙම ආයතන නාමික ආයතන බවට පත්වී රාජ්‍ය සේවය දේශපාලනීකරණය වූ බව සඳහන් කල යුතුය.
II. නමික විධායකය ජනාධිපතිධූරය බව සඳහන් කර පත්කිරීම, තත්වය, බලතල හා කාර්යයන් දක්වා අවසානයේ එය බලයෙන් හා ගෞරවයෙන් පහත හෙලන ලද තනතුරක් බැවින් එය ව්‍යවස්ථාමය සැරසිල්ලක් බව සඳහන් කල යුතුය.
III. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය 1972 ව්‍යවස්ථාවේ නවාංගයක් බව සඳහන් කර එහි සංයුතිය, නිල කාලය, පිහිටවූ අරමුණු සහ එහි ක්‍රියාපටිපාටිය දැක්විය යුතුය.

### III. කොටස

08. I. ගැටුම් අධ්‍යයනයේ පුරෝගාමී ඇමරිකානු විද්වතෙකු වන ලුවිස් ක්‍රිස්බර්ග් ඉදිරිපත් කල අදහසකි.
ගැටුමේ ජීවන චක්‍රය ඇඳ එහි අවධි නම් කිරීම.
එම අවස්ථා කෙටියෙන් විස්තර කල යුතුය.

II. ප්‍රතිපත්ති ක්‍රියාදාමය අවධි කිහිපයකින් සමන්විත චක්‍රයක් බව සඳහන් කිරීම
එහි පියවර දැක්වීම පිළිවෙලින් කල යුතුය
i. න්‍යායපත්‍රය සකස් කිරීම.
ii. ප්‍රතිපත්ති සැකසීම.
iii. ප්‍රතිපත්ති ක්‍රයාවට නැංවීම.
iv. ප්‍රතිපත්ති ඇගයීම.
v. ප්‍රතිපත්ති සංශෝදනය.
vi. ප්‍රතිපත්ති ඇවර කිරීම. (ආදිය තිබේ නම් වඩාත් සම්පූර්ණය)
ඒවා කෙටියෙන් විස්තර කර තිබීම ප්‍රමාණවත් වේ.

III. ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණය පාඩමේ සඳහන් පරිදි ප්‍රජාතන්ත්‍රවාදී හා ප්‍රජාතාන්ත්‍රවාදී නොවන අංග ඉදිරිපත් කර තිබිය යුතුය.


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

IV. *රාජාණ්ඩු හා සමූහාණ්ඩු යන ආණ්ඩුක්‍රම ලක්ෂණ මිශ්‍ර වූ ආණ්ඩු මෙන්ම ජනාධිපති පාර්ලිමේන්තු ක්‍රමවල හා ආණ්ඩුක්‍රමවල ලක්ෂණ එකතුවෙන් ගොඩනැගුණ ආණ්ඩුක්‍රම වේ.

* වඩාත් ජනප්‍රිය ආණ්ඩුක්‍රම ස්වරූපය වන්නේ පාර්ලිමේන්තු හා ජනාධිපති ක්‍රමයේ මූලික අංග ලක්ෂණ සහිත ජනාධිපති ක්‍රමය බව දැක්විය යුතුය.

* මෙහි ප්‍රධාන ලක්ෂණ ලිවිය යුතුය.

* ක්‍රියාත්මක වන රටවල්ද දැක්විය යුතුය.

09. * ඉන්දියානු සන්ධිය ක්‍රමය සම්භාවය සන්ධිය ක්‍රමයෙන් වෙනස් වූ ආකෘතියක් බව සඳහන් කරමින් පිළිතුර ආරම්භ කළ යුතුය. 1947 නිදහසින් පසු ඉන්දියාවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස්කිරීමේදී වෙනස්කම් සහිත නව සන්ධීය රාමුවක් නිර්මාණය කිරීම කල බව සඳහන් කල හැකිය.

* ඉන්දියානු සන්ධීය ක්‍රමය අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රමයක් බව පෙන්වාදිය හැකිය. ඊට බලපෑ හේතු වන්නේ

1. සන්ධිය ක්‍රමයක දක්නට ලැබෙන ලක්ෂණ ඉන්දිය ආණ්ඩුක්‍රමය තුල පැවතියද ව්‍යවස්ථාව මගින් ඒකීයද සන්ධීයද යන්න ප්‍රකාශ නොකිරීම.
2. ව්‍යවස්ථාවේ 352 වගන්තියෙන් මධ්‍යම රජය ලබා දී ඇති හදිසි අවස්ථා බලතල වලින් ප්‍රාන්ත රාජ්‍ය වල බලය දැඩිලෙස සීමා වීම. ජාතික හදිසි අවස්ථාවකදී අඛන්ඩතාවය, ආරක්‍ෂාව සහ ස්ථාවරභාවය ආරක්ෂා කිරීම සම්පූර්ණ බලය මධ්‍යම ආණ්ඩුව සතු වීම.

03. ව්‍යවස්ථාවේ 356 වන වගන්තියට අනුව, ප්‍රාන්ත ආණ්ඩු විසුරුවා හැරීමේ හා ඒවා ජනාධිපති පාලනය යටතට ගැනීමේ බලය ජනාධිපතිවරයාට තිබීම.

ආදී තොරතුරු විස්තරාත්මකව දක්වා තිබිය යුතුය. ඊට අමතරව ඉන්දීය රාජ්‍ය ක්‍රමයේ ඇති ඒකීය ලක්ෂණ පහත පරිදි දැක්විය යුතුය.

I. ඒකීය පුරවැසිභාවය.

II. සමගාමී ලැයිස්තුව මධ්‍යම ආණ්ඩුවට වාසිදායක වීම.

III. ප්‍රාන්ත රාජ්‍යකට අයත්වන භූමිය තීරණය කිරීමට මධ්‍යම රජයට ඇති තනි බලය.

IV.ප්‍රාන්ත රාජ්‍යය බිහිකිරීමට නම්කිරීමට හා පවතින ඒවා වෙනස් කිරීමට මධ්‍යම රාජ්‍යයට ඇති බලය.

V.මධ්‍යම පාර්ලිමේන්තුවේ උත්තර මණ්ත්‍රී මණ්ඩලය වන රාජ්‍ය සභාවේ 2/3 ක අනුමැතිය ඇතිව ප්‍රාන්ත රාජ්‍ය සඳහා නීතිපැනවීමට මධ්‍යම පාර්ලිමේන්තුවට ඇති බලය.

10. I. 'නිරාගමිකවාදය' යන්නෙහි අදහස ආගම හා දේශපාලනය මිශ්‍ර කර නොගැනීම වුවත් නිරාගමිකවාදය යනු ආගමට විරුද්ධ තර්කයක් නොවන බවත් සඳහන් කරමින් පිළිතුරු ආරම්භ කල හැකිය.
ඉන් පසු මෙහි ආරම්භය සඳහන් කරමින් ලිබරල් නිරානමිකවාදය හා සමාජවාදී නිරානමිකවාදයේ මූලධර්ම කෙටියෙන් දැක්විය යුතුය.
ඉන්දියානු නිරානමිකවාදයේ මූලික ඉගැන්වීම් දැක්විය යුතුය.

II. තුලනාත්මක ප්‍රවේශය හදුන්වා උදාහරණ ලබා දී එහි ප්‍රධාන ධාරා තුන දැක්වීම ප්‍රමාණවත්ය.

III. නව ලිබරල්වාදී ආර්ථික හා දේශපාලන ප්‍රතිසංස්කරණ විසින් පහසුකම් සපයනු ලැබූ ක්‍රියාවලියක් ලෙස ගෝලීයකරණය හඳුන්වා දිය හැකිය.
ඉන්පසු ගෝලීයකරණ ක්‍රියාවලිය ජාතික රාජ්‍යයේ සීමා නොතකා එම සීමා බිඳගෙන පැතිරුණු බව විස්තර කල යුතුය. ජාතික රාජ්‍ය දුර්වල වීම ගෝලීයකරණයේ ප්‍රතිඵලයක් සේ දැක්විය යුතුය.

IV. බලපෑම් කණ්ඩායම් අර්ථ දක්වා ඇමරිකාව තුල හඳුන්වන ආකාරයද දක්වා ලංකාව තුල ක්‍රියාකාරීත්වයද සඳහන් කල යුතුය.
දේශපාලන පක්ෂ වලින් වෙනස් වන ආකාරය සඳහන් කර තිබේ නම් එය වඩාත් උචිත වේ.
ඉනු පසු මේවාට පක්ෂව හා විපක්ෂව ගොඩනැගී ඇති තර්ක ඉදිරිපත් කල හැකිය.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

WWW.LOL.LK

# BUY

## PAST PAPERS

071 777 4440

Buy Online - www.LOL.lk

- GCE O/L
- GCE A/L
- PAST PAPERS
- SHORT NOTES



Protect Yourself From Coronavirus

# YOU STAY AT HOME




# WE DELIVER!

**ORDER NOW**

**075 699 9990**

**WWW.LOL.LK**

LOL.lk
Learn Ordinary Level

**TOP CATEGORIES**

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

HUGE SALE – SHOP NOW




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

GCE O/L Exam



GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
− 1 + ADD TO CART




GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
− 1 + ADD TO CART



GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
− 1 + ADD TO CART



GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00



GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00



GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00